



- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.)

(01) ලවය 4 වන හරය 5 වන භාග සංඛ්‍යාව ලියන්න.

(02) 1 සිට 10 තෙක් ඔත්තේ සංඛ්‍යා කුලකය අවයව මගින් ලියන්න.

(03) රේඛා ඛණ්ඩයේ දිග මැන ලියන්න.





(04) $1\frac{5}{100}$ දශමයක් ලෙස දක්වන්න.

(05) හාරසිය පස් මිලියන නවසිය අටදහස් හත්සියය සම්මත ආකාරයට ලියන්න.

06) $\frac{3}{7} + \frac{2}{7} + \frac{1}{7}$ හි අගය සොයන්න.

(07) මෙම සංඛ්‍යා රේඛාවේ සලකුණු කර ඇති සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.




Mathsland

(08) $\frac{3}{5} - \frac{2}{10}$ අගය සොයන්න. [redacted]

(09) 16.4 - 8.32 සුළු කරන්න.

(10) රූපයේ නිරූපණය වන කෝණ වර්ග දෙක කුමක්ද?




a = ......................................................................

b = ......................................................................

(11) වාහන නවතා තබන වාහන අංගනයක එක් පේළියක වාහන 27 බැගින් පේළි 25 ක් ඇත. වාහන අංගනයේ ඇති වාහන ගණන සොයන්න.

---

(12) 433 x 331 යන ගුණිතයේ පිළිතුර ගුණ කිරීමෙන් තොරව ඔත්තේ ද ඉරට්ටේ ද යන්න ලියන්න.

---

(13) 15.2 ඝනක රාමුවක දක්වන්න.


---

(14) දොඩම් යුෂ 450 m*l* කට ජලය 3 *l* 650 m*l* එකතු කර සෑදිය හැකි බීම ප්‍රමාණය ලීටර කොපමණද?

---

(15) කෙසෙල් කැනක මුල් ඇවරියේ ගෙඩි 15 ක් ඇත. කෙසෙල් ඇවරි 11 ක් ඇති එම කෙසෙල් කැනේ ගෙඩි ගණන නිමානය කරන්න.

Mathsland

(16) 

මෙම රූපයේ පරිමිතිය 36 cm නම් එක් පාදයක දිග සොයන්න.

---

(17) 5 වන සමචතුරස්‍ර සංඛ්‍යාව කීයද?

---

(18) 64 හි සාධක ලියන්න.

---

(19) 14.3 cm + 158 cm + 10.8 cm අගය සොයන්න.

---

(20) අම්මා වෙළඳ පොළට නිවසින් පිටත්ව ගියේ පෙ.ව. 10.45 ටය. නැවත නිවසට පැමිණියේ ප.ව. 3.00 ටය. අම්මාට වෙළඳ පොළට ගොස් ආපසු නිවසට පැමිණීමට ගතවූ කාලය සොයන්න.

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමිවේ.
- වෙනත් කඩදාසියක පිළිතුරු සපයා 1 පත්‍රයට අමුණන්න.

Mathsland

(01) (a) වෙළෙන්දෙක් තමා ගෙනා අන්නාසි තොගයක් $\frac{1}{3}$ මල්ලිට දුන් අතර $\frac{1}{5}$ ක් අත්පිට මුදලට විකුණුවේය.

(i) වෙළෙන්දා මල්ලිට දුන් හා අත්පිට මුදලට විකුණු අන්නාසි ප්‍රමාණය මුළු අන්නාසි තොගයෙන් කවර භාගයක්ද?

(ii) වෙළෙන්දා මල්ලිට දුන් හා අත්පිට මුදලට විකුණු අන්නාසි ප්‍රමාණයේ වෙනස මුලු අන්නාසි වලින් කවර භාගයක්ද?

(b) සුළු කරන්න. (i) $\frac{3}{5} - \frac{7}{15}$ (ii) $\frac{5}{7} + \frac{3}{14}$

(c) $8.73 + 3.2 = 11.75$ බව සමීර පවසයි. ඔහුගේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.

(02)

| ගිරවා | නයා | හාවා | ගැරඬියා | මයිනා | කොහා | කොට්ටියා | පොළඟා |
|---|---|---|---|---|---|---|---|

(i) ඉහත කොටුව තුළ ඇති නම් නිරීක්ෂණය කර ඔවුන්ගේ පොදු ලක්ෂණ අනුවA, B, C කොටස් තුනකට වෙන්කර ඔබේ උත්තර පත්‍රයේ ලියන්න.

A B C

(ii) ඔබ විසින් නම් කරන ලද එක් එක් කාණ්ඩ වලට සුදුසු නම බැගින් සඳහන් කරන්න.

A = ..........................................................

B = ..........................................................


C = ..........................................................

(iii) "කොරවක්කා" මෙම කාණ්ඩ තුනෙන් අයත් වන කාණ්ඩය කුමක්ද? හේතු දක්වන්න.

(iv) පන්තියක සිටින සිසුන් සංඛ්‍යාව ආසන්න දහයේ ගුණාකාරයට වැටැයූ විට 50 ක් විය. පන්තියේ සිටිය හැකි,

(a) අඩුම සිසුන් සංඛ්‍යාව කීයද? (b) වැඩිම සිසුන් සංඛ්‍යාව කීයද?

(03)




(i) A භාජනයේ ප්‍රමාණය *ml* වලින් ලියන්න

(ii) B භාජනයේ ප්‍රමාණය *ml* වලින් ලියන්න.

(iii) C භාජනයේ ප්‍රමාණය *l* වලින් ලියන්න.

(iv) ප්‍රමාණය අනුව භාජන තුන ආරෝහණ පිළිවෙලට සකස් කරන්න.

(v) භාජන තුනේ මුළු ප්‍රමාණය *l* සහ *ml* වලින් වෙනම සොයන්න.

(04) (i) 1, 3, 6, 10 ..................... යන සංඛ්‍යා රටාව හඳුන්වන නම ලියන්න.

(ii) එහි 15 වන පදය සොයන්න.

(iii) 105 වන්නේ එහි කීවෙනි පදයද?

(iv) 1, 4, 9 ......... යන සංඛ්‍යා රටාව හඳුන්වන නම කුමක්ද?

(v) එහි 121 වන්නේ කීවෙනි පදයද?

(vi) 100 සහ 200 අතර, මෙම සංඛ්‍යා රටාවේ ඇති පද මොනවාද?


(vii) ප්‍රථමක සංඛ්‍යාව යන්න හඳුන්වන්න.

(05) (a) (i) පැත්තක දිග 6cm වූ සමපාද ත්‍රිකෝණයක පරිමිතිය සොයන්න.

(ii) පැත්තක දිග 10cm වූ සමචතුරස්‍රාකාර පාත්තියක පරිමිතිය සොයන්න.

(iii) පැත්තක දිග 45cm හා පළල 35cm වූ පින්තූරයක පරිමිතිය සොයන්න.

(b) පහත රූප නිරීක්ෂණය කර එහි ඇති ඉලක්කම් වගුව තුල ගැලපෙන පරිදි යොදන්න.




| නම | රූපයට හිමි අංකය |
|---|---|
| සමාන්තරාස්‍රය | |
| සෘජුකෝණාස්‍රය | |
| සමචතුරස්‍රය | |
| ත්‍රපීසියම | |
| සෘජුකෝණී ත්‍රිකෝණය | |

Mathsland

(06) (a) සීඝ්‍රගාමී දුම්රියක් ගාල්ල සිට කොළඹ දක්වා යාමට පැය 2 යි මිනිත්තු 30 ක් ගත කළේය. එම වේලාවටම පිටත් වූ බස් රියකට ගාල්ල සිට කොළඹ දක්වා යාමට පැ. 3 යි මි. 40 ක් ගතවිය.

I. මගියෙක් බසයේ ගමන් නොකර දුම්රියේ ගමන් කළේ නම් ඔහුට ඉතිරි වන කාලය මිනිත්තු කීයද?

II. දුම්රිය සහ බස්රිය ගාල්ලෙන් පෙ.ව. 8.45 ට එකවර පිටත් වූයේ නම් දුම්රිය හා බස්රථය කොළඹට පැමිණි වේලාවන් මොනවාද?

(b) ගුවන් ගමන් පිටත් වූ වේලාව සහ පැමිණි වේලාව පහත වගුවේ දැක්වේ.
ගමනට ගතවූ කාලය සොයන්න.

| නගරය | පිටත් වූ වේලාව | පැමිණි වේලාව | ගමනට ගතවූ කාලය |
|---|---|---|---|
| කොළඹ - චෙන්නායි | 16 : 00 | 17 : 10 | |
| ඩුබායි - කොළඹ | 18 : 30 | 22 : 35 | |
| කොළඹ - මාලේ | 02 : 45 | 03 : 40 | |
| බැංකොක් - කොළඹ | 19 : 20 | 21 : 50 | |

(c) අන්තර්ජාතික සම්මත ආකාරයට පැය 24 ඔරලෝසුවෙන් වේලාව ලියන්නේ කෙසේද?